0198

සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2025
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2025
General Certificate of Education (Adv. Level) Examination, 2025

ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය I
கிறிஸ்தவ நாகரிகம் I
Christian Civilization I

49 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

**උපදෙස්:**

- ※ **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ※ උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
- ※ උත්තර පත්‍රයේ පසු පිටේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
- ※ **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **පිළිතුරු පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක්** (×) **යොදා දක්වන්න.**

**1.** නයිල් ගඟ ගලා බසින්නේ,
(1) රතු මුහුදට ය. (2) ඉන්දියන් සාගරයට ය. (3) මධ්‍යධරණී මුහුදට ය.
(4) පර්සියන් බොක්කට ය. (5) වික්ටෝරියා විලට ය.

**2.** ග්‍රීක් භාෂාව පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) පලස්තීනයේ පර්සියානු සමයේ දී ග්‍රීක භාෂාව පෝෂණය විය.
(2) ග්‍රීක භාෂාවෙන් පරිවර්තනය කරන ලද බයිබලය 'තාර්ගුම්' යැයි හැඳින්විණ.
(3) ග්‍රීක භාෂාව සහ හේබ්‍රෙව් භාෂාව අතර සබඳතාවක් ඇත.
(4) ග්‍රීක භාෂාව සහ සංස්කෘත භාෂාව අතර සබඳතාවක් ඇත.
(5) බැබිලෝනියානු විප්‍රවාස සමයේ ජුදාවරු ග්‍රීක භාෂාව උගත්හ.

**3.** ශිෂ්ටාචාරය හා සම්බන්ධ භූගෝලීය ඒකකය කුමක්ද?
(1) කන්ද (2) ගම (3) කැලෑව
(4) තැන්න (5) නගරය

**4.** මේ අතුරෙන් නිවැරදි යුගලය කුමක් ද?
(1) බැසිලිකාව - සෘජුකෝණාස්‍රාකාර ආකෘතිය
(2) වල්ගේට් - ග්‍රීක භාෂාව
(3) ටයිබර් ගඟ - සිරියාව
(4) සෙප්ටුවාජින්ත බයිබලය - ලතින් භාෂාව
(5) පැට්‍රීෂියන්වරු - ෆිනීෂිය

**5.** ක්‍රිස්තියානි ජනවන්දනාවේ දී දණ නමස්කාර කිරීමේ පිළිවෙත කිනම් සංස්කෘතියෙහි ආභාසයක්ද?
(1) ඊජිප්තු (2) බැබිලෝනියානු (3) අසිරියානු
(4) ග්‍රීක (5) රෝම

**6.** ආබ්‍රහම් සහ සාරා භූමදාන කර ඇත්තේ,
(1) හේබ්‍රොන්හි ය. (2) මම්රිහි ය. (3) බෙයාර්ෂෙබාහි ය.
(4) ඌර්හි ය. (5) හාරාන්හි ය.

**7.** සාවුල් රජ අයත් වූයේ කුමන ගෝත්‍රයටද?
(1) ජුදා (2) සිමියොන් (3) රූබන්
(4) බෙන්ජමින් (5) ලෙවී

**8.** අන්තියෝකස් එපිපානෙස් නම් ග්‍රීක පාලකයාට එරෙහිව අරගල කිරීමට නායකත්වය දුන් කණ්ඩායම වූයේ,
(1) එසේනිවරු ය. (2) සෙලොට්වරු ය. (3) මකබිවරු ය.
(4) ලේකම්වරු ය. (5) ජෙබුසිවරු ය.

Past Papers Wiki



9. පහත ප්‍රකාශ සලකන්න.

A – ජෙරබොවාම් රජ පාලනය
B – රෙහොබොවාම් රජ පාලනය
C – එළියා දිවැසිවරයාගේ සේවාව
D – අසිරියානුවන් විසින් විප්‍රවාසගත කරනු ලැබීම
E – දේව මාලිගය විනාශ කරනු ලැබීම

මේ අතුරෙන් පුරාණ ඊශ්‍රායෙලයේ උතුරු රාජ්‍යය පිළිබඳ නිවැරදි ප්‍රකාශ වනුයේ,

(1) A, B සහ C ය. (2) A, C සහ D ය. (3) B, C සහ D ය.
(4) B, C සහ E ය. (5) B, D සහ E ය.

10. තිබේරියස් (තිබේරියා) නගරය ගොඩනැගූ පාලකයා කවුරුන් ද?

(1) හෙරෝද් ඇන්ටිපස් (2) පිලිප් (3) අර්කෙලාවුස්
(4) I හෙරෝද් අග්‍රිප්පා (5) II හෙරෝද් අග්‍රිප්පා

11. පහත ප්‍රකාශ සලකන්න.

A – ඔවුහු ඔවුන් සතු වස්තුව පොදුවේ තබාගත්හ.
B – මොවුහු ගලීල මුහුද අද්දර ජීවත් වූහ.
C – නිශ්ශබ්දතාව රැකීම මොවුන්ගේ ප්‍රධාන අංගයක් විය.
D – නාසරතයේ ජේසු ජීවත්වූ සමයේ ඔවුහු නොසිටියහ.
E – රෝම හමුදා ඔවුන්ගේ වාසස්ථාන සහමුලින් ම විනාශ කළහ.

මේ අතුරෙන් එසේනිවරු පිළිබඳ නිවැරදි ප්‍රකාශ වනුයේ,

(1) A, B සහ C ය. (2) A, B සහ D ය. (3) A, C සහ E ය.
(4) B, C සහ D ය. (5) C, D සහ E ය.

12. පෙන්තකෝස්ත මංගල්‍යය මගින් සමරන ලද්දේ,

(1) නික්මයාම සිදුවීමයි.
(2) සීනායි ගිවිසුමයි.
(3) බැබිලෝනියානු විප්‍රවාසයේ අවසානයයි.
(4) දේව මාලිගය කැපකිරීමයි.
(5) ග්‍රීක පාලනයෙන් මිදීමයි.

13. ජෙරුසලමේ දේව මාලිගාව නැවත ගොඩනැගීමේ කටයුතු ආරම්භ කරන ලද්දේ කාගේ නායකත්වය යටතේ ද?

(1) සයිරස් (2) ඇලෙක්සැන්ඩර් (3) සෙරුබ්බාබෙල්
(4) සලමොන් (5) II දාරියස්

14. ජේසු සමයේ ජුදයාවේ රෝම ආණ්ඩුකාරවරු වාසය කරන ලද්දේ,

(1) ජෙරුසලමේ ය. (2) මෙගිද්දොහි ය. (3) මසදාහි ය.
(4) ෂෙකෙම්හි ය. (5) සෙසාරියාවේ ය.

15. මතෙව් ශුභාරංචියේ ලුණු සහ ආලෝකය පිළිබඳ ඉගැන්වීම සඳහන් වන්නේ,

(1) වපුරන්නාගේ උපමාවේ ය. (2) දූල පිළිබඳ උපමාවේ ය.
(3) කන්ද උඩ දේශනයේ ය. (4) අවසාන රාත්‍රී භෝජනයේ දී ය.
(5) අවසාන විනිශ්චය පිළිබඳ දේශනයේ ය.

16. "නියමිත මොහොත පරිපූර්ණ වී තිබේ. දෙවියන් වහන්සේගේ රාජ්‍යය ආසන්න ය. මනස්ථාපනය වන්න. සුබඅස්න අදහාගන්න." (මාක් 1:15) මෙය ප්‍රකාශ කරන ලද්දේ,

(1) ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ විසිනි. (2) ස්නාවක ජොහාන්තුමා විසිනි. (3) පේදුරුතුමා විසිනි.
(4) සිමියොන් විසිනි. (5) පාවුලුතුමා විසිනි.

17. දේව රාජ්‍යයේ ස්වභාවය පිළිබිඹු කරන උපමා ඇතුළත් වරණය තෝරන්න.

(1) නිධානය, මුතු ඇටය සහ යහපත් එඬේරා
(2) නැතිවූ බැටළුවා, මුතු ඇටය සහ කන්‍යාවියන් දසදෙනා
(3) නිධානය, මුතු ඇටය සහ යහපත් සමරිතානුවරයා
(4) නිධානය, මුතු ඇටය සහ මුහුන්
(5) අබ ඇටය, මුහුන් සහ කන්‍යාවියන් දසදෙනා

**18.** "දේව පුත්‍ර ක්‍රිස්තුස් වහන්සේ පිළිබඳ සුබ අස්නේ ආරම්භය මෙය ය" යන්න මුල්වැකිය ලෙස සඳහන් වන ශුභාරංචිය වන්නේ,
(1) මතෙව් ය. (2) මාක් ය. (3) ලූක් ය.
(4) ජොහාන් ය. (5) තෝමස් ය.

**19.** පහත ප්‍රකාශ අතුරෙන් **වැරදි** ප්‍රකාශය කුමක් ද?
(1) ජුදා සම්ප්‍රදාය ශුද්ධවූ සම්ප්‍රදායකි.
(2) අයබදු අයකරන්නන් සමග ජේසුස් වහන්සේ සමීප සබඳතා පවත්වන ලදී.
(3) සමාරිය ක්‍රි.පූ. 722 දී බැබිලෝනිය විසින් ආක්‍රමණය කරන ලදී.
(4) ජේසුස් වහන්සේ සමාරියයන්ට කිසිදු වෙනසක් නොපෙන්වන ලදී.
(5) ජුදා සමාජය විසින් අයබදු අයකරන්නන් පව්කරුවන් සේ සලකන ලදී.

**20.** පාස්කු මංගල්‍යයේ උච්චතම අවස්ථාව එළඹෙන්නේ,
(1) ස්වර්ගාරෝහණයේ දී ය. (2) ශුද්ධාත්මාගමනයේ දී ය.
(3) පාවුලුතුමාගේ සිත්හැරීමේ දී ය. (4) ජෙරුසලම් මන්ත්‍රණ සභාවේ දී ය.
(5) ක්‍රිස්තුස් වහන්සේගේ දෙවන පැමිණීමේ දී ය.

**21.** ශු. පාවුලුතුමාට උත්ථානවූ ජේසුස් වහන්සේ මුල්වරට හමුවූයේ කවර නගරයට යමින් සිටියදී ද?
(1) ජෙරුසලමට (2) තාර්සසයට (3) අන්තියෝකියට
(4) දමස්කයට (5) එපීසයට

**22.** පහත ප්‍රකාශ සලකන්න.
A – මෙතෙක් ශුභාරංචිය දැනනොගත් අයට ශුභාරංචිය දේශනා කිරීම
B – සකල ජාතීන් ශ්‍රාවකයන් කිරීම
C – ජෙරුසලම් මන්ත්‍රණ සභාවේ තීරණ දන්වා, ශක්තිමත් කර, ස්ථිර කිරීම
D – ඇදහිලිවන්තයන් ශක්තිමත් කර ස්ථිර කිරීම
E – අන්‍ය ජාතිකයින් අතර ජුදා නීතිය ප්‍රචලිත කිරීම
මේ අතුරෙන් ශු. පාවුලුතුමාගේ ධර්මදූත චාරිකාවන් පිළිබඳ නිවැරදි ප්‍රකාශ වන්නේ,
(1) A, C සහ D ය. (2) A, C සහ E ය. (3) B, C සහ D ය.
(4) B, C සහ E ය. (5) C, D සහ E ය.

**23.** ශු. පාවුලුතුමා විසින් රචිත 1 කොරින්ති ලිපියෙහි සඳහන් ධර්මතා මොනවා ද?
(1) ඇදහිල්ල, බලාපොරොත්තුව සහ ප්‍රේමය
(2) ඇදහිල්ල, බලාපොරොත්තුව සහ ප්‍රඥාව
(3) ප්‍රේමය, ප්‍රඥාව සහ දැනුම
(4) ප්‍රඥාව, ප්‍රේමය සහ දැහැමිබව
(5) දැහැමිබව, දැනුම සහ ප්‍රඥාව

**24.** "ශ්‍රේෂ්ඨ දිවැසිවරයෙක් අප අතර පහළ වී සිටියි. දෙවියන් වහන්සේ සිය සෙනඟ ගලවන්නට වැඩිය සේක" (ලූක් 7:16). යන්න ජනතාව විසින් ප්‍රකාශ කරන ලද්දේ කුමන ප්‍රාතිහාර්ය සිදුකිරීමෙන් අනතුරුව ද?
(1) මහ ලේ රෝගයෙන් පෙළුණු ස්ත්‍රිය සුවකිරීම
(2) නායින් නුවර වැන්දඹුවගේ පුතා මරණින් නැගිටුවීම
(3) පූප වැඩි කිරීම
(4) කානානීය ස්ත්‍රියගේ දියණියගේ අශුද්ධාත්මය සුව කළ අවස්ථාව
(5) සුළඟ නිශ්චල කළ අවස්ථාව

**25.** පාප්වරු අවිඤ්ඤොන්හි ජීවත්වූ වසර හැත්තෑවක කාලපරිච්ඡේදය නම් කරන ලද්දේ,
(1) ඊජිප්තුවේ වහල්භාවය ලෙස ය. (2) රෝමයේ වහල්භාවය ලෙස ය.
(3) අසිරියාවේ විප්‍රවාසය ලෙස ය. (4) බැබිලෝනියානු විප්‍රවාසය ලෙස ය.
(5) ග්‍රීක විප්‍රවාසය ලෙස ය.

Past Papers Wiki



26. පහත ප්‍රකාශ සලකන්න.
A – ජුදාවරු දාවිත් වැනි බලවත් රජෙකු බලාපොරොත්තු වූහ.
B – දිළිඳු වඩුවෙකුගේ පුත්‍රයා වූ ජේසුස් වහන්සේ මෙසියස් ලෙස පිළිගැනීම ප්‍රතික්ෂේප කරන ලදී.
C – ක්‍රිස්තියානිවරු ආගිය සැමතැන්හි ම සුබඅස්න පැතිරවූහ.
D – ජුදා නායකයෝ කිතුනු දහමේ වර්ධනය නිසා ඔවුන්ගේ බලය ගිලිහේ යැයි බියවූහ.
E – ක්‍රිස්තියානිවරුන් රෝම ආණ්ඩුකාරවරුන්ගෙන් වැඩි වරප්‍රසාද ලැබී ය.
මේ අතුරෙන් ජුදා පීඩන පිළිබඳ නිවැරදි ප්‍රකාශ වන්නේ,
(1) A, B සහ C ය. (2) A, B සහ D ය. (3) B, C සහ D ය.
(4) B, C සහ E ය. (5) C, D සහ E ය.

27. පස්වැනි රෝම පීඩනයේ දී මරණයට පත්කරනු ලැබූ ප්‍රාණපරිත්‍යාගිවරුන් වූයේ,
(1) ශු. ජස්ටින්තුමා, ශු. ඉරේනියස්තුමා සහ ශු. සිප්‍රියන්තුමා ය.
(2) ශු. ෆෙලිසිටාතුමිය, ශු. ජස්ටින්තුමා සහ ශු. සිසිලියාතුමිය ය.
(3) ශු. ඉරේනියස්තුමා, ශු. ෆෙලිසිටාතුමිය සහ ශු. පර්පෙචුවාතුමිය ය.
(4) ශු. පේදුරුතුමා , ශු. ඉරේනියස්තුමා සහ ශු. සීමන්තුමා ය.
(5) ශු. පාවුලුතුමා, ශු. පර්පෙචුවාතුමිය සහ ශු. ෆේබියන්තුමා ය.

28. ආලෝකය-අඳුර, ශරීරය-ආත්මය සහ ජීවිතය-මරණය යන ප්‍රතිවිරෝධී අදහස් ඇතුළත් දර්ශනය වන්නේ,
(1) ස්ටොයික්වාදය ය. (2) එපිකියුරියන්වාදය ය.
(3) ප්ලෙටොනිකවාදය ය. (4) ඇරිස්ටොටේලියානුවාදය ය.
(5) නොස්ටික්වාදය ය.

29. ක්‍රිස්තියානියට බලපෑ රෝම භාවිතයන් වන්නේ,
(1) භාෂාව, ගෘහනිර්මාණ ශිල්පය, ධූරාවලි බල ව්‍යුහය සහ ජනවන්දනා සම්ප්‍රදායන් ය.
(2) භාෂාව, ගෘහනිර්මාණ ශිල්පය, ප්‍රවාහනය සහ ජනවන්දනා සම්ප්‍රදායන් ය.
(3) ගෘහනිර්මාණ ශිල්පය, ධූරාවලි බල ව්‍යුහය, අධ්‍යාපනික මූලධර්ම සහ ජනවන්දනා සම්ප්‍රදායන් ය.
(4) භාෂාව, ගෘහනිර්මාණ ශිල්පය, ආධ්‍යාත්මික චින්තන සහ ප්‍රවාහනය ය.
(5) ධූරාවලි බල ව්‍යුහය, ආහාර පුරුදු, ජනවන්දනා සම්ප්‍රදායන් සහ ආධ්‍යාත්මික චින්තන ය.

30. නිවැරදි යුගලය තෝරන්න.
(1) ඇලෙක්සැන්ඩ්‍රියාවේ ක්ලෙමන්ට් - තියෝපිලස් සමග සංවාදය
(2) ඔරිගන් - ආධ්‍යාත්මික ජීවිතයේ රහස
(3) ශු. ජස්ටින් - ඇපලොජියා
(4) යුසේබියස් - ක්‍රිස්තුස් වහන්සේගේ බයිබලීය පදනම
(5) ටර්ටූලියන් - වේදභේදයනට එරෙහිව

31. තාපස ජීවිතය සඳහා බලපෑ සාධක කිහිපයක් වනුයේ,
(1) පීඩා, වේදභේද සහ සභාව බෙදීම ය.
(2) බහුදේවවාදය, රූප වන්දනාව සහ කුරුස යුද්ධ ය.
(3) පීඩා, බහුදේවවාදය සහ සභාව බෙදීම ය.
(4) රූප වන්දනාව, බහුදේවවාදය සහ සභාව බෙදීම ය.
(5) පීඩා, වේදභේද සහ රූප වන්දනාව ය.

32. 'ජර්මනියේ ධර්මදූතවරිය' ලෙස නම්කරන ලද්දේ කවුරුන්ව ද?
(1) ශු. ලියෝබා (2) ශු. ඇග්නස් (3) ශු. අගතා
(4) ශු. ෆ්ලෝරා (5) ශු. ගර්ට්රූඩ්

33. පහත ප්‍රකාශ සලකන්න.
A – වෛද්‍ය සහාය ලබාදීම
B – ශිෂ්ට සම්පන්න ජීවිතය පිළිබඳ ඉගැන්වීම
C – ග්‍රීක සහ රෝම ශිෂ්ටාචාරවල ගුණදහම් (virtues) ඉදිරිපත් කිරීම
D – නිවාස අහිමිවූවන්ට නිවාස සැපයීම
E – ඔවුන් කිතුනු අනුගාමිකයන් කිරීම
මේ අතුරෙන් රදගුරුවරු විසින් යුරෝපීය ගෝත්‍රිකයන් අතර සිදුකරන ලද සේවාව සම්බන්ධ නිවැරදි ප්‍රකාශ වනුයේ,
(1) A, B සහ C ය. (2) A, B සහ D ය. (3) A, B සහ E ය.
(4) B, C සහ D ය. (5) B, C සහ E ය.

**34.** දොමිනිකානු නිකායේ ප්‍රධාන පැවිදිවරුන් දෙදෙනෙකු වනුයේ,
(1) ශු. මහා ඇල්බට්තුමා සහ ශු. අන්තෝනිතුමා ය.
(2) ශු. මහා ඇල්බට්තුමා සහ ශු. බර්නාඩ්තුමා ය.
(3) ශු. තෝමස් ඇක්වයිනාස්තුමා සහ කාල් රානර් ය.
(4) ශු. තෝමස් ඇක්වයිනාස්තුමා සහ ශු. බර්නාඩ්තුමා ය.
(5) ශු. මහා ඇල්බට්තුමා සහ ශු. තෝමස් ඇක්වයිනාස්තුමා ය.

**35.** මධ්‍යතන යුගයේ දී සිදු කරන ලද නව දේශගවේෂණයන් හේතුවෙන් මුහුදු වෙරළ ආශ්‍රිත ශිෂ්ටාචාරය හඳුන්වා දුන් නාවිකයන් වූයේ,
(1) කොලම්බස් සහ ඇමරිගෝ වෙස්පුඩි (වෙස්පූචි) ය.
(2) වස්කෝ ද ගාමා සහ නිකොලස් කොපර්නිකස් ය.
(3) කොලම්බස් සහ නිකොලස් කොපර්නිකස් ය.
(4) වස්කෝ ද ගාමා සහ කොලම්බස් ය.
(5) වස්කෝ ද ගාමා සහ ඇමරිගෝ වෙස්පුඩි (වෙස්පූචි) ය.

**36.** මාටින් ලූතර් විසින් ප්‍රතික්ෂේප කරන ලද ඉගැන්වීම් වූයේ,
(1) පූර්ණ ඵල, ශුද්ධිකාගිනිස්ථානය සහ බෞතිස්මය ය.
(2) පූර්ණ ඵල, ශුද්ධිකාගිනිස්ථානය සහ සාන්තුවරයන් ය.
(3) ශුද්ධිකාගිනිස්ථානය, පූර්ණ ඵල සහ දිව්‍ය සත්ප්‍රසාදය ය.
(4) සභාවේ නොවරදින සුළුබව, සාන්තුවරයන් සහ බෞතිස්මය ය.
(5) පූර්ණ ඵල, සාන්තුවරයන් සහ 'ඇදහිල්ල පමණ ය'.

**37.** උල්රිච් ස්විංග්ලි විසින් ප්‍රතික්ෂේප කරන ලද ඉගැන්වීම් වූයේ,
(1) පැවිදි පොරොන්දු, පූජක බ්‍රහ්මචර්යාව, බෞතිස්මය සහ දිව්‍ය සත්ප්‍රසාදය ය.
(2) පූජක බ්‍රහ්මචර්යාව, ශුද්ධවන්තයන්ගේ මැදිහත්වීම, බෞතිස්මය සහ පූර්ණඵල ය.
(3) ශුද්ධවන්තයන්ගේ මැදිහත්වීම, ශුද්ධවූ ත්‍රිත්වය, ස්වර්ගාරෝහණය සහ දිව්‍ය සත්ප්‍රසාදය ය.
(4) පැවිදි පොරොන්දු, පූජක බ්‍රහ්මචර්යාව , ශුද්ධවන්තයන්ගේ මැදිහත්වීම සහ ශුද්ධිකාගිනිස්ථානය ය.
(5) ශුද්ධිකාගිනිස්ථානය, ශුද්ධවන්තයන්ගේ මැදිහත්වීම, ශුද්ධවූ ත්‍රිත්වය සහ බෞතිස්මය ය.

**38.** 'මීසම් පාසල්' හඳුන්වා දුන් තාපස නිකාය වූයේ,
(1) බෙනදිකාන ය. (2) ප්‍රැන්සිස්කානු ය. (3) අගොස්තිනියානු ය.
(4) සැලේසියානු ය. (5) සිස්ටර්ෂියන් ය.

**39.** චාලිමේන් රජුගේ (මහා චාල්ස්) කලාව සහ දර්ශනය මණ්ඩපයේ සුවිශේෂ කාර්යභාරයක් ඉටුකළ තාපසවරුන් දෙදෙනෙකු වනුයේ,
(1) තෝමස් ඇක්වයිනාස් සහ අල්ක්වින් (ඇලුසින්) ය.
(2) අල්ක්වින් (ඇලුසින්) සහ එයින් කාමු (අයින් හාඩ්) ය.
(3) බොනවැන්චර් සහ බර්නාඩ් ය.
(4) එයින් කාමු (අයින් හාඩ්) සහ බර්නාඩ් ය.
(5) ඩොමිනික් සහ අල්ක්වින් (ඇලුසින්) ය.

**40.** ස්පාඤ්ඤයේ සලමන්කා පාසලට 'විශ්වවිද්‍යාලය' යන පදවි නාමය ප්‍රදානය කළ පාප්තුමා කවරෙක් ද?
(1) I උර්බානු (2) II පියුස් (3) XIII ජුවාම්
(4) IV ඇලෙක්සැන්ඩර් (5) XV බෙනඩික්ට්

**41.** පහත ප්‍රකාශ සලකන්න.
A – දෙවියන් වහන්සේගේ ස්වභාවය දෙවියන් වහන්සේගෙන් පමණක් නික්මෙයි.
B – චින්තන හැකියාවෙන් යුත් මිනිසුන් අවසානයේ දෙවිඳුන් හා එක් වේ.
C – චින්තන හැකියාව සතු සියලු මනුෂ්‍යයන්ගේ මාර්ගය ක්‍රිස්තුස් වහන්සේ ය.
D – මිනිස් මනස මගින් මැවීම සහ සදාතනික ජීවිතය පැහැදිලි වේ.
E – ක්‍රිස්තියානින් නොවන්නන් හට දෙවියන් පිළිබඳ පහදාදීම
මේ අතුරෙන් 'සුම්මා තියොලොජියා' සම්බන්ධ නිවැරදි ප්‍රකාශ වනුයේ
(1) A, B සහ C ය. (2) A, B සහ D ය. (3) B, C සහ D ය.
(4) B, C සහ E ය. (5) C, D සහ E ය.

PAST PAPERS WIKI

● අංක **42** සහ **43** ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත වගුව යොදාගන්න.

| | | | | |
|---|---|---|---|---|
| A - ඔරතෝරියානු සංගීතය | B - සිස්ටයින් දෙව්මැදුර | C - ෆ්ලොරන්ස් කලා සම්ප්‍රදාය | D - ෆ්‍රෙස්කෝ | E - කන්‍යා මරියතුමියගේ විවාහ දර්ශනය |
| F - අවසාන රාත්‍රී භෝජනය | G - ලුඩ්විග් බිතෝවන් | H - මැඩෝනා | I - අවසාන විනිශ්චය | J - ශා. සොෆියා දේවස්ථානය |

**42.** චිත්‍ර ශිල්පී මයිකල් ඇන්ජලෝ සම්බන්ධ යුගලය වනුයේ,
(1) A සහ F ය. (2) B සහ I ය. (3) C සහ G ය. (4) D සහ H ය. (5) E සහ I ය.

**43.** චිත්‍ර ශිල්පී රෆායෙල් සන්සියෝ සම්බන්ධ යුගලය වනුයේ,
(1) A සහ J ය. (2) B සහ F ය. (3) C සහ G ය. (4) D සහ I ය. (5) E සහ H ය.

**44.** පහත ප්‍රකාශ සලකන්න
A – කතෝලික සභාවේ සාමාජිකයෙකු ලෙස සිටිමින් ස්වාධීනව ක්‍රියාත්මක වේ.
B – නායකත්වය, පෙරදිග සභාවල සහා පියවරුන්ගේ ක්‍රමයට සමානකම් කියයි.
C – බටහිර සම්ප්‍රදායට සමාන ජනවන්දනා පිළිවෙත් දැකිය හැකි ය.
D – තෝමස් ක්‍රිස්තියානි සභා අතුරෙන් විශාලතම නිදහස් සභාව ය.
E – පාප්තුමාගේ මගපෙන්වීම් සහ ලතින් වන්දනා පිළිවෙත් පිළිගනී.
මෙම ප්‍රකාශ අතුරෙන් සීරෝ මලබාර් සභාව සම්බන්ධ නිවැරදි ප්‍රකාශ වනුයේ,
(1) A, B සහ C ය. (2) A, B සහ D ය. (3) B, C සහ D ය.
(4) B, C සහ E ය. (5) C, D සහ E ය.

**45.** ක්‍රි.ව. 1617 දී පෘතුගීසි ධර්මදූතවරුන් විසින් හලාවත දී වේදිකාගත කරන ලද ආගමික නාට්‍යය වූයේ,
(1) ගිව්සුම සහ දේවමෑණියෝ ය.
(2) කිතු උපත ය.
(3) ක්‍රිස්තුස් වහන්සේගේ ජීවන චර්යාව, ආදම් සහ ඒව ය.
(4) රජතුන් කට්ටුව වාසාප්පු ය.
(5) කොන්ස්තන්තීනු අධිරාජ්‍යයාගේ සිත්හැරීම ය.

**46.** ඇමරිකානු මිෂනාරිවරුන් විසින් කිතුදහම ප්‍රචාරය කිරීම අරමුණු කොටගෙන හඳුන්වා දෙනු ලැබූ සඟරාව කුමක් ද?
(1) භක්ති ප්‍රබෝධනය (2) කැතලික් ගාඩියන් (3) ඥානාර්ථ ප්‍රදීපය
(4) උදයතාරගෙ (5) මන්නා

**47.** පහත ප්‍රකාශ සලකන්න
A – රෝමයේ ග්‍රෙගෝරියානු විශ්වවිද්‍යාලයේ කථිකාචාර්යවරයෙක් ලෙස සේවය කළේ ය.
B – ගාල්ලේ ශා. ඇලොයිසියස් විද්‍යාලයේ ගුරුවරයෙකු ලෙස සේවය කළේ ය.
C – මතෙව් ශුභාරංචිය සිංහලට පරිවර්තනය කරන ලදී.
D – ලංකා ඉතිහාසය (Ceylon History) ග්‍රන්ථය සම්පාදනය කරන ලදී.
E – ඉන්දියාවේ සේරාම්පූර් විශ්වවිද්‍යාලයේ කථිකාචාර්යවරයෙක් ලෙස සේවය කළේ ය.
මේ අතුරෙන් එස්. ජී. පෙරේරා පියතුමා සම්බන්ධ නිවැරදි ප්‍රකාශ වනුයේ,
(1) A, B සහ C ය. (2) A, B සහ D ය. (3) B, C සහ D ය.
(4) B, D සහ E ය. (5) C, D සහ E ය.

**48.** "දියුණුව හුදු ආර්ථික අංගයක් ලෙස නොබැලිය යුතු ය. දියුණුව දෙස ධාර්මිකව බැලිය යුතු ය." මෙම ප්‍රකාශය සඳහන් සමාජ ඉගැන්වීම් පිළිබඳ ලියවිල්ල වන්නේ,
(1) රේරුම් නොවාරුම් (*Rerum Novarum*) ය.
(2) චෙන්තේසිමුස් අන්නුස් (*Centesimus Annus*) ය.
(3) සොලිසිටිඩෝ රෙයි සෝවාලිස් (*Solicitudo Rei Socialis*) ය.
(4) ලව්දාතෝ සී (*Laudato Si*) ය.
(5) දේවුස් කරිතාස් එස්ත් (*Deus Caritas est*) ය.

**49**. ආසියානු රදගුරු සම්මේලනයේ සාමාජිකත්වය දරණ නැගෙනහිර ආසියානු රදගුරු සම්මේලන වන්නේ,

(1) ශ්‍රී ලංකා, ජපාන සහ ඉන්දුනීසියානු ය.
(2) ජපාන, මියන්මාර සහ පාකිස්ථානු ය.
(3) ඉන්දියානු, තායිවාන සහ මැලේසියානු ය.
(4) සිංගප්පූරු, දකුණු කොරියානු සහ පිලිපීන ය.
(5) ජපාන, දකුණු කොරියානු සහ තායිවාන ය.

**50**. ලෝක කිතුනු සභා සම්මේලනයේ (World Council of Churches) ප්‍රථම පොදු සම්මේලන තුන පවත්වනු ලැබුවේ පිළිවෙළින්,

(1) නවදිල්ලි , උප්සලා සහ නයිරෝබිහි දී ය.
(2) එවැන්ස්ටන්, නයිරෝබි සහ වැන්කුවර්හි දී ය.
(3) ඇම්ස්ටර්ඩෑම්, නයිරෝබි සහ කැන්බරාහි දී ය.
(4) ඇම්ස්ටර්ඩෑම්, එවැන්ස්ටන් සහ නවදිල්ලිහි දී ය.
(5) ඇම්ස්ටර්ඩෑම්, එවැන්ස්ටන් සහ නයිරෝබිහි දී ය.

* * *

Past Papers Wiki



AL/2025/49/S-II

සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2025
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2025
General Certificate of Education (Adv. Level) Examination, 2025

ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය II
கிறிஸ்தவ நாகரிகம் II
Christian Civilization II

49 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

**උපදෙස් :**

※ I කොටසින් ප්‍රශ්න **දෙකක්** ද, II කොටසින් ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

## I කොටස

**1.** (i) පුරාණ ඊශ්‍රායෙල් රාජ්‍යය බෙදීයාමෙන් පසු උතුරු රාජ්‍යයේ දේශනා කළ දිවැසිවරු **දෙදෙනකු** නම් කරන්න. (ලකුණු 02යි)

(ii) බැබිලෝනියානු විප්‍රවාසය සම්බන්ධ කරුණු **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04යි)

(iii) අපර විප්‍රවාසි යුගයේ සේවය කළ පූජක එස්රාගේ දායකත්වය විස්තර කරන්න. (ලකුණු 06යි)

(iv) පුරාණ ඊශ්‍රායෙලයේ රාජ්‍ය පාලනය ආරම්භවීමට තුඩුදුන් කරුණු සාකච්ඡා කරන්න. (ලකුණු 08යි)

**2.** (i) ජුදා ආගමික සම්ප්‍රදායන් **දෙකක්** නම් කරන්න. (ලකුණු 02යි)

(ii) ශුභාරංචි ග්‍රන්ථයන්හි දක්නට ලැබෙන ප්‍රාතිහාර්ය වර්ග **හතරක්** නම් කරන්න. (ලකුණු 04යි)

(iii) ස්තොයිකවාදය පිළිබඳ කෙටි විස්තරයක් ලියන්න. (ලකුණු 06යි)

(iv) ජුදා විවාහයේ ලක්ෂණ පැහැදිලි කරන්න. (ලකුණු 08යි)

**3.** (i) අන්තියෝකියානු ගුරුකුලයට අයත් චින්තකයින් **දෙදෙනකු** නම් කරන්න. (ලකුණු 02යි)

(ii) ඒරියන් වේදභේදයෙහි ඉගැන්වීම් **හතරක්** පෙළගස්වන්න. (ලකුණු 04යි)

(iii) ක්‍රිස්තියානි පැවිදි ජීවිතය කෙරෙහි ශු. පැකෝමියස්තුමාගේ දායකත්වය විස්තර කරන්න. (ලකුණු 06යි)

(iv) රෙප්‍රමාදු (ක්‍රිස්තියානි) ප්‍රතිසංස්කරණයට ඉවහල් වූ ආගමික පසුබිම පැහැදිලි කරන්න. (ලකුණු 08යි)

[දෙවැනි පිටුව බලන්න

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාළ ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

## II කොටස

4. (i) 'ක්‍රිස්තියානි එකමුතුකම' පිළිබඳ ශු. පාවුලුතුමාගේ ඉගැන්වීම් පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

(ii) විවිධ ගැටුම්කාරී සන්දර්භයන්හි සාමය ගොඩනැගීම අරභයා ක්‍රිස්තියානි සංඝවල දායකත්වය කෙසේ විය හැකි දැයි සාකච්ඡා කරන්න. (ලකුණු 10යි)

5. (i) ග්‍රීක ශිෂ්ටාචාරයේ මූලිකාංග ඉදිරිපත් කරන්න. (ලකුණු 10යි)

(ii) ශ්‍රී ලාංකේය සංස්කෘතියේ වර්ධනයට ග්‍රීක ශිෂ්ටාචාරය දායක විය හැකි අන්දම සාකච්ඡා කරන්න. (ලකුණු 10යි)

6. (i) ග්‍රෙගෝරියන් සහ පොලිෆනි සංගීතයේ මූලිකාංග පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

(ii) ශුද්ධවූ සංගීතය සම්බන්ධයෙන් ශ්‍රී ලාංකේය ක්‍රිස්තියානි සභා මුහුණදෙන අභියෝග සහ ඒ සඳහා ගත හැකි ක්‍රියාමාර්ග විස්තර කරන්න. (ලකුණු 10යි)

7. (i) ශ්‍රී ලංකාවේ ලන්දේසි පාලන සමයේ කතෝලික ඇදහිල්ල ආරක්ෂා කිරීම සඳහා ශු. ජුසේවාස් මුනිතුමන්ගේ දායකත්වය විස්තර කරන්න. (ලකුණු 10යි)

(ii) ලෞකිකරණය වූ වත්මන් ලෝක යථාර්ථය හමුවෙහි කිතුනු ඇදහිල්ල සුරක්ෂිත කර, නගා සිටුවිය හැකි ආකාරය සාකච්ඡා කරන්න. (ලකුණු 10යි)

8. (i) ලෝක කිතුනු සභා සම්මේලනයේ ආරම්භය පිළිබඳ රචනයක් ලියන්න. (ලකුණු 10යි)

(ii) දේශය ගොඩනැගීම අරභයා විවිධ ක්‍රිස්තියානි සභාවනට දායකවිය හැකි අන්දම සාකච්ඡා කරන්න. (ලකුණු 10යි)

* * *

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi
Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library